


ලිතුකි සිතුලිමා ජයවික්‍රම

අපේ අසල්වැසියා

ලිතුකි සිතුලිමා ජයවික්‍රම

ISBN - 978-624-208-733-7

# පිදුම

ආදරණීය විදුහල්පතිතුමියටත්,
අකුරු කියාදෙන නිල්මිණි වික්‍රමතිලක පන්තිභාර ගුරුතුමියටත්,
පොත ලිවීම සඳහා උපදෙස් ලබාදුන් සියලුම ගුරු දෙමාපියන්ටත්,
මාගේ දෙමාපියන්ටත්,
මෙම පොත පුද කරමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනිමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනා ගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,


ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

මම උදෑසන අවදි වූයේ පාසල් යාමටය. පාසල් වෑන් රථය පැමිණෙන තුරු පාර අසළට වී සිටි මාත් අම්මාත් එකවරම දුටුවේ පාර අයිනේ ගසක් යට සිටින පවුලකි.



ඒ කවුරුන්දැයි යන්න ඇසීමට අම්මා දෙස බලනවාත් සමඟම අනේ පවු! අසරණ පවුලක් කියා අම්මා කිවුවා. මට ඒ අය එතන සිටින්නේ ඇයි කියා දැන ගැනීමට සිතුණත් වෑන් රථය පැමිණි නිසා පාසලට යාමට සිදු වුණා.




පාසලට ගියත් හිතට මතක් වුණේම ඒ අය කවුරුන් කියා දැන ගැනීමටය. පාසල් ඇරෙන තුරු බලා සිටි මම සීනුව නාද වු වහාම වැන් රථය වෙත ගියේ ඉක්මණින් නිවස බලා යාමටය. වැන් රථයෙන් බැස්ස ගමන්ම මම බැලුවේ අර අය දෙසය.




මල්ලී කෙනෙක් හා කකුලක් බැඳ සිටි තාත්තා කෙනෙක් දැක ගැනීමට වුවත්, උදේ සිටි අම්මා සිටියේ නෑ. ඒ පුංචි මල්ලීට මම සිනාසුණා. මල්ලී තාත්තා ළඟට වේගයෙන් දිවුවා.


මම එනතුරු පාරට වී බලා සිටි අම්මා හෙමින් හෙමින් ඉදිරියට ආවාය. ඇය අර මාමා ළඟට පැමිණ ''ඔයගොල්ලන් කවුද?'' කියා ඇසුවා.



අසරණ මාමා ''කලින් හිටිය තැනින් අපව එළවලා දැම්මා'' යැයි පැවසුවා. මුදල් ගෙවා ගැනීමට නොහැකි වීම එයට හේතුව බව දැනගත් අම්මා නිවසට පැමිණි මොහොතේ සිට පව් අර මිනිස්සු යැයි කිහිප වතාවක්ම පවසනවා මට ඇසුණා. අම්මා, තාත්තා සමඟ කිහිප විටක්ම පැවසුවේ හරියට මේ අය අපේ නිවසට කැඳවා ගෙන එන අදහසින් දැයි මට සිතුණා.



පසුවදා පාසලට යන අතර අම්මා අමතර පෙට්ටියකට කෑම එකක් දානවා මම දැක කාටද අම්මා යැයි ඇසුවෙමි. දුවේ අර මල්ලිට හරියට කෑමක්වත් නෑ, අපි දෙමු මේක කියා අම්මා කිවුවා. අම්මා කෑම එක දෙන ගමන් හැමදාම මෙතන ඉන්නද හිතාගෙන ඉන්නේ කියා ඇසුවාය.



ඔව්, අපිට යන්න තැනක් තිබුණානම් කියා කඳුළු පිරි ඇස් වලින් ඒ තාත්තා කීවා. දවසක් අම්මා අපේ ගෙදර වත්තේ තැනක් සුද්ද කරමින් සිටි අතර ඒ අර මිනිස්සුන්ට ඉන්න යැයි පැවසුවා. මට සතුට කියාගත නොහැකි විය. එයාලා අපේ ගෙදර වත්තේ අලුතින් හැදුව නිවසට ආවා.



මම පාසල් යන හැමදාම මල්ලීත් එක්කන් යන්නට හිතුණා. දවසක් මම මල්ලීට ගෙදර ඉස්කෝලයක් දැම්මා. මම ටීචර් මල්ලීත් එයාගෙ සෙල්ලම් බඩුත්, මගෙ පුසාත් පන්තියේ ළමයි වුණා.



දවසක් මම අම්මාට කිවුවා අර මල්ලීත් ඉස්කෝලෙට එක්කන් යන්න ඕනේ කියලා. අම්මා කිහිප සැරයක්ම මල්ලීගෙන් ඇහුවා ''පුතේ ඔයා ඉස්කෝලෙකට දාන්නද කියලා. ඒ හැම තිස්සෙම මල්ලි හිනා වුණා විතරයි.

අම්මා මල්ලීගේ තාත්තාගෙන ඇහුවා අපි පුතාව පාසලකට දාන්නද කියලා. ඒ තාත්තා මොනවත් නොකියාම අපේ අම්මාට වැන්දා. අම්මා හරි හරි අපි පුතාව ඉස්කොලෙකට දාන්නම් කීවා.



ටික දවසකින් අම්මා වෙහෙස මහන්සි වී මල්ලීව පාසලකට ඇතුළත් කළා. ඒ මල්ලිගේ අම්මා හා තාත්තා අපි සමඟ ගොඩක් හිතවත් වුණා. අපිට ඒ අය නැතිව බැරි වුණා. එදා සිට එයාලා අපේ හොඳම අසල්වැසියා වුණා.



# ස්තූතිය

මාගේ මේ ''අපේ අසල්වැසියා''
කතන්දර පොත නිර්මාණයට
උදව් කළ ආදරණීය අම්මා,
දෙමාපියන් ඇතුළු සියලු දෙනාට
මාගේ ස්තූතිය පුද කරමි



## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔනැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාශිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්